පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, සබරගමුව - සති පාසල

Department of Education,Sabaragamuwa Province/ Weekly School

ශ්‍රේණිය - 10

විෂය - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යනය

සතිය - 11-1

**නිපුණතාවය :- 5.මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරයට පිටපත් කරය**

**නිපුණතා මට්ටම :- 5. 10 . ගනුදෙනු මූලික පොත් වල සටහන් කිරීමේ දී සහ ලෙජරය ට පිටපත් කිරීමේ දී සිදුවූ වැරදි නිවැරදි කරයි .**

**පාඩම-** ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම

**ඉගෙනුම් පල -** ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීමේ අවශ්‍යතාවයල ගිණුම්කරණ වැරදි සිදුවිය හැකි අවස්ථා ගිණුම්කරණ වැරදි හදුනා ගැනීම ශේෂ පිරික්සුමේ සමානත්වය ට බල නොපාන වැරදි

**ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -**

ඔබගේ පෙළ පොතේ පිටු අංක 163 සිට171 දක්වා හොදින් කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න .

කෙටි සහ නිශ්චිත පිළිතුරු සපයන්න .

01. ශේෂ පිරික්සුමේ සමානත්වය ට බලපාන වැරදි යනු කුමක්ද ?

02. ශේෂ පිරික්සුමේ සමානත්වය ට බලපාන වැරදි අනාවරණය කර ගන්නා තෙක් ශේෂ පිරික්සුමේ වෙනස පිටපත් කරනු ලබන්නේ කුමන ස්ථානයකට ද ?

03. අවිනිශ්චිත ගිණුම යනු කුමක්ද ?

04. අවිනිශ්චිත ගිණුමක් විවෘත කිරීමට අදාල පියවර නම් කරන්න .

**ව්‍යාපාරයක ගනුදෙනු වාර්තා කිරීමේ දී සිදුවී ඇති පහත වැරදි නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහන් ලියන්න .**

* . රු. 12,000ක ප්‍රවාහන වියදම් මුදල් පොතේ පමණක් සටහන් කර ඇත .

* . රු.25,000ක අත්පිට විකුණුම් මුදල් පොතේ නිවැරදිව සටහන් කර විකුණුම් ගිණුමේ රු. 52,000 ක් ලෙස සටහන් වී ඇත .

* .ණය හිමියෙකු ට ගෙවන ලද රු. 15,000 මුදල් පොතට බැර කර ණයහිමි ගිණුමට ද බැර කර ඇත .

* . ගොඩනැගිලි ගිණුම තුලනය කිරීමේදී එහි එකතුව රු. 10,000 ක් වැඩියෙන් එකතු කර ඇත .

* . රු. 50,000 ක් වූ කාර්යාල උපකරණ ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට ඇතුළත් කර නොමැත .

- ඉහත වැරදි නිවැරදි කිරීමට අදාල අවිනිශ්චිත ගිණුම පිලියෙල කර ආරම්භක ශේෂය ගණනය කරන්න .

ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

I. e - තක්සලාව - ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම (moe.gov.lk)
II. ගුරුගෙදර - නැත
III. වෙනත් -Youtube - https://youtu.be/5vAPs9Ey_f0
IV. අතිරේක කියවීම් පොත්/ සඟරා - පෙළපොත හොඳින් අධ්‍යනය කිරීම ප්‍රමාණවත් වේ.

ඔබේ දැනුම පිරික්සීමට මෙම යොමුව සමග සම්බන්ද වන්න.

Business _ Accounting Studies - Google Drive

සැකසුම - නම - .G.N.සදමාලි.................... තනතුර - .....ස. අ. අ..(වාණිජ).......

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**